## 6 වන ශ්‍රේණිය

# ඉතිහාසය

## විෂය නිර්දේශය

## (2007 වර්ෂයේ සිට 6 වන ශ්‍රේණිය සඳහා)


සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

2006



Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## හැඳින්වීම

ඉතිහාසය ඉගෙනීම යනු මානව ශිෂ්ඨාචාරයේ වර්ධනයේ දී සිදු වූ දේශපාලන, ආර්ථික, සමාජීය , ආගමික , සමාජීය , ආගමික සහ සංස්කෘතික ක්ෂේත්‍රවල මතු වූ ගැටළු සහ ජයග්‍රහණවල විවිධාකාර ස්වභාවය තුලනාත්මකව හා විවේචනාත්මකව අවබෝධ කර ගැනීමයි. එය පරිසරය හා ජාතික උරුමයන් රැකගනිමින් සියළු මනුෂ්‍ය වර්ගයාට එක්ව විසීමට හැකි යහපත් සමාජයක් ගොඩනැගීමේ අරමුණු පෙරදැරි වන්නක් විය යුතු යි.

1997 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් මෙම අරමුණු සහිතව සමාජ අධ්‍යයනය විෂය "සමාජ අධ්‍යයනය හා ඉතිහාසය " නමින් හඳුන්වා දෙන ලදි.

ඒ තුළින් වුව ද අපේක්ෂිත අරමුණු ඉටු නොවුනු බවට ගොනු වූ අනාවරයනයක් හේතුවෙන් 2005 වසරේ සිට ඉතිහාසය තනි විෂයයක් ලෙසට 7 සිට 9 දක්වා ශ්‍රේණි සඳහා හඳුන්වා දෙන ලදි.

2007 වසරේ සිට ක්‍රියාත්මක විමට නියමිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරන තුළින් ද 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ඉතිහාසය පාසල් විෂය මාලාවේ හර විෂයක් ලෙසින් ඇතුලත් කර ඇත. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දෙන පාසල් විෂය මාලාව නිපුණතා පදනම් කරගෙන සකස් වූවකි. 6 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා වූ ඉතිහාසය විෂයමාලාව සැලසුම් කිරීමේ දී හඳුනාගත් විෂය නිපුණතා පදනම් කරගෙන සකස් කරන ලදි.

6 වන ශ්‍රේණියේ සඳහා වූ මෙම විෂය නිර්දේශය ද එහි ප්‍රතිඵලයකි. මෙය 2007 වසරේ සිට ක්‍රියාත්මක විමට නියමිතයි. තේමා අටක් සහ ව්‍යාපෘතිවලින් සමන්විත මෙම විෂය නිර්දේශයට ශ්‍රී ලංකාව හා ලංකාව සම්බන්ධයෙන් බලපෑමක් ඇති කළ ලෝකයේ ඓතිහාසික සිදුවීම් ද තේමා සඳහා තෝරා ගෙන ඇත.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 2.0 විෂයයේ පොදු නිපුණතා

- ඓතිහාසික විකාශය හා ප්‍රවණතා පිළිබඳ දැනුවත් වෙයි.
- වර්තමානය තේරුම් ගැනීම සඳහා අතීතය පිළිබඳ දැනුම ඉවහල් කරගත හැකි ආකාරය විමර්ෂණය කරයි.
- ජාතික ප්‍රශ්න දෙස තුලනාත්මකව බැලීමට හැකි ආකල්ප වර්ධනය කර ගනියි.
- වැදගත් ඓතිහාසික පුද්ගලයන්ගේ චරිතා ප්‍රදාන ආශ්‍රයෙන් ජාතික අගයන් ගොඩ නගා ගනියි.
- ඉතිහාසය ඇසුරෙන් ජාතික අනන්‍යතාවය හඳුනා ගැනීමට පෙළෙඹෙයි.
- ඉතිහාසයෙන් ඉදිරිපත් කෙරෙන හර පද්ධතීන් වර්තමාන සංසිද්ධීන් සඳහා ඵලදායීව භාවිතා කරයි.

## 2.0 6 වන ශ්‍රේණියට අදාළ නිපුණතා

- ඉතිහාසය යන්න අර්ථ කථනය කරයි.
- මානව ශිෂ්ඨාචාරයේ ප්‍රභවය හා පසුබිම පිළිබඳ අධ්‍යයනය කරයි.
- ශ්‍රී ලංකාව ජනාවාස වීම පිළිබඳව තොරතුරු අධ්‍යයනය කරයි.
- අනුරාධපුර යුගයේ රජවරුන්ගේ කාර්ය සංසිද්ධීන් අගය කරයි.
- අනුරාධපුර යුගයේ ආගමික පුනර්ජීවනය විස්තර කරයි.
- අනුරාධපුර යුගයේ සංවර්ධන ක්‍රියාවලිය අගය කරයි.
- ප්‍රාදේශීය ඉතිහාසය පදනම් කරගත් ව්‍යාප්තීන්හි නිරතවෙයි.

ඉහත නිපුණතාවන් වර්ධනය වීමෙන් පහත දැක්වෙන නිපුණතාව ශිෂ්‍යයන් ලඟා කර ගනියි.

- ඉතිහාසය ඉගෙනීමේ වටිනාකම අභිමානයෙන් පිළිගනියි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 3.0 පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

ඉතිහාසය විෂය නිර්දේශයේ අන්තර්ගතය විෂය කරුණු සාර්ථකව හා ඵලදායි ලෙස අධ්‍යයනය කිරීමටත් ඒ තුළින් ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීම සඳහාත් ශිෂ්‍ය සහභාගීත්වය වර්ධනය වන ආකාරයට පාසල් වැඩ සටහන් සම්පාදනය කර ගැනීම අතිශයින්ම ප්‍රයෝජනවත්ය. එම වැඩ සටහන් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ජීවිතයට මෙන්ම ඔවුන් අයත්වන ප්‍රජාවගේ යහ පැවැත්වමට ද ප්‍රයෝජනවත්වන ඒවා විය යුතුය.

මෙහි යෝජනා කොට ඇත්තේ එවැනි පාසල් වැඩ සටහන් කිහිපයක් පමණි. මේ අනුව වෙනත් නිර්මාණාත්මක වැඩ සටහන් හා ප්‍රතිපත්ති සකස් කර ගැනීමේ නිදහස ඉතිහාසය උගන්වන ගුරුවරයාට හිමි වන බව සලකන්න.

- ඉතිහාසය සංගමයක් පිහිටුවීමෙන් සිසු දැනුම ප්‍රවර්ධනය සඳහා සාකච්ඡා, සම්මන්ත්‍රණ, වාද විවාද, ප්‍රදර්ශන, සඟරා, බිත්ති පුවත් පත් නිර්මාණය යන කාර්යයන්ට යොමු කළ හැකි ය.
- යටත් පිරිසෙයින් වසරකට වරක්වත් ඓතිහාසික වැදගත්කමකින් යුත් ස්ථානයකට හෝ ප්‍රදේශයකට අධ්‍යාපන චාරිකා සංවිධානය කළ හැකිය. පන්ති කාමරයේ දි ලබාගත් දැනුම තහවුරුකර ගැනීමට හා වර්ධනයකර ගැනිමට හැකිවන පරිදි පූර්ව සැලසුමකින් යුතුව අධ්‍යාපන චාරිකා සංවිධානය කිරීම වැදගත් වෙයි.
- පුද්ගල සම්මන්ත්‍රණ මගින් දිවයිනේ පිළිගත් ඉතිහාසඥයින් පාසලට කැඳවා ඔවුන්ගේ අත්දැකීම් බෙදා හදා ගැනීමට අවස්ථා සැලසිය හැකිය.
- පුරාවස්තු විනාශයට යමින් පවතින මෙවන් යුගයක ප්‍රදේශයේ පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්මාරක පිළිබඳ සොයා බැලීම හා ඒවා ආරක්ෂා කිරීම සඳහා පාසල හා සම්බන්ධ ප්‍රජා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට පුළුවන.
- ඉතිහාසය පාඩම්වලට අදාළවන චිත්‍ර, මූර්ති, කැටයම් හා වෙනත් කෞතුක වස්තු නිරීක්ෂණය කිරීමටත්, නිරීක්ෂණ වාර්තා සැපයීමටත් හැකිවන පරිදි කෞතුකාගාර වැඩ සටහන් සංවිධානය කිරීම යෝග්‍යවෙයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 4.0 ඉගැන්වීමේ උපාය මාර්ග හා කාලපරිච්ඡේද

ඉතිහාසය උගන්වන ගුරුවරයා, තොරතුරු ලබා දෙන්නෙකුට වඩා තොරතුරු ලබා ගැනීමට තම සිසුන් පොළඹවන්නකු ලෙස කටයුතු කරන්නේ නම් ඉගැන්වීමේ කාර්යය වඩා ඵලදායි වනු ඇත.  මේ සඳහා හැකි සෑම අවස්ථාවකදීම සාකච්ඡාව, මූලාශ්‍ර පරිහරණය, නිරීක්ෂණය වැනි කාර්යයන්ට සිසුන් යොමු කිරීම මැනවි.  ඉතිහාසය අර්ථාන්විතව අධ්‍යයනය කිරීම සඳහා සිසුන් යොමු කරවිය හැකි ක්‍රියාමාර්ග කිහිපයක් පහත දැක්වේ.

- ජාතික කෞතුකාගාර සහ ප්‍රාදේශීය කෞතුකාගාර යනාදිය මගින් සැලසුම් කළ වැඩ සටහනක් යටතේ  කෞතුක වස්තු නැරඹීමට අවස්ථාව සැලසීම. සිසුන් ප්‍රදේශයේ ඉතිහාසය සෙවීමට උනන්දුකර ඒ මගින් ජාතික ඉතිහාසය වෙත යොමු කිරීම.
- මාධ්‍යවලින් තොරතුරු ලබා ගැනීමට අවස්ථාව සැලසීම. (ගුවන් විදුලි හා රූපවාහිනී අධ්‍යාපන සේවා)
- ඓතිහාසික වැදගත්කමින් යුත් ස්ථාන නැරඹීමට උනන්දු කරවීම.
- මූලාශ්‍ර භාවිතයට උනන්දු කරවීම.
- සිසු කුසලතාවලට අවස්ථා සැලසෙන පරිදි බිත්ති පුවත් පත් සඟරා, ප්‍රදර්ශන, පාසල් කෞතුකාගාර ඇරඹීම වැනි කටයුතු කෙරෙහි ධෛර්යය දීම.
- කාලීන ප්‍රශ්න දෙස මධ්‍යස්ථව හා යථාර්ථවාදීව බැලිය හැකි ඵලදායි පුරවැසියකු බිහි කිරීමේ කාර්යයට ඉතිහාසය විෂය ඉගැන්වීමෙන් ඔබට දායක විය හැකිය.  ඒ සඳහා ඔබ සතු වගකීම ඉතා විශාලය.

### යෝජිත කාලපරිච්ඡේද

| **6 ශ්‍රේණිය** | **විෂය ඒකක** | **කාලපරිච්ඡේද** |
|---|---|---|
| | 6.1 | 02 |
| | 6.2 | 08 |
| | 6.3 | 05 |
| | 6.4 | 08 |
| | 6.5 | 10 |
| | 6.6 | 12 |
| | 6.7 | 08 |
| | 6.8 | 06 |
| | äæõ< | 60 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 5.0 තක්සේරුකරණය හා ඇගයුම

පරීක්ෂණ හා ඇගයුම කාර්ය පහත සඳහන් ආකාරයට සංවිධානය කිරීම සුදුසුය.

### පන්ති කාමරය තුළ ඇගයුම්

ලිඛිත පරීක්ෂණ, වාචික පරීක්ෂණ, ව්‍යාපෘති වැඩ වැනි ක්‍රියාමාර්ගවලින් සංවිධානය කර ගත හැකිය. මේ සඳහා පාසල පදනම් කරගත් ඇගයුම් ක්‍රියාවලියේ දක්වා ඇති නිදර්ශන අනුසාරයෙන් ඇගැයීම් උපකරණ සකසා ගැනීම ප්‍රයෝජනවත්ය.

### වසර අවසානයේ ඇගයුම්

වසර අවසානයේ පවත්වන පාසල් මට්ටමේ හෝ කලාපීය මට්ටමේ හෝ පළාත් මට්ටමේ ලිඛිත පරීක්ෂණයකට සිසුන් ඉදිරිපත් කළ හැකිය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# 6 ශ්‍රේණිය

# ඉතිහාසය විෂය නිර්දේශය

ඒකකය 6.1

## නිපුණතා

ඉතිහාසය යන්න අර්ථ කථනය කරයි.

## අනු නිපුණතා

- ඉතිහාසය යනු කුමක් දැයි අර්ථ දක්වයි.
- ඉතිහාසය ඉගෙනීමෙන් අත්වන ප්‍රයෝජන අගය කරයි.

## විෂය අන්තර්ගතය                    කාලපරිච්ඡේද 03

6.1 හැඳින්වීම

6.1.1 ඉතිහාසය යනු කුමක් ද

6.1.2 ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන

## යෝජිත ඉගෙනුම් ක්‍රියාකාරකම්

- ඉතිහාසය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න අවබෝධකර ගැනීම සඳහා විදුහලේ හෝ ගමේ හෝ වතුයායේ ඉතිහාසය ගවේෂණය කිරීම.

## ගුණාත්මක යෙදවුම්

- ලොග්පොත
- ලිපිලේඛන
- සමරු ඵලක
- ඡායාරූප
- පැරණි උපකරණ
- ඓතිහාසික, පූජනීය ස්ථාන
- ජනප්‍රවාද
- පාසැල , ගම, වතුයාය, පිළිබඳව තොරතුරු දන්නා වැඩිහිටියන් , පූජකයන්, ප්‍රභූන්

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඒකකය 6.2

නිපුණතාව:

- මානව ශිෂ්ටාචාරයේ ප්‍රභවය හා පසුබිම පිළිබඳ ව අධ්‍යයනය කරයි.

## අනු නිපුණතා

- මිනිසා දඩයක්කරුවෙකු, සංචාරක එඬේරයෙකු සහ ගොවියෙකු ලෙස ගත කළ ජීවිතය පිළිබඳ තොරතුරු විග්‍රහ කරයි.
- මිනිසා දඩයම් යුගයේ සිට ගොවි යුගය දක්වා පරිවර්තනය වීමට බලපෑ හේතු විස්තර කරයි.
- මානව ශිෂ්ටාචාර විකාශනයේ දී අත්පත් කරගත් ජයග්‍රහණ පිළිබඳ අභිමානයෙන් කථා කරයි.
- අනාගත මිනිසාගේ ජයග්‍රහන පිළිබඳ ලැයිස්තුවක් සකස් කරයි.

විෂය අන්තර්ගතය කාලපරිච්ඡේද 08

6.2 මානව සංවර්ධනයේ මග සලකුනු

6.2.1 දඩයම් යුගය.

6.2.2 එඬේර යුගය

6.2.3 ගොවි යුගය

ඉහත 6.2.1, 6.2.2 හා 6.2.3 යන කොටස් ඉගැන්වීමේ දී පහත දැක්වෙන අංග කෙරේ අවධානය යොමු කරන්න.

- මූලික අවශ්‍යතා
  ආහාර , ඇඳුම්, නිවාස.
- භාවිතා කළ උපකරණ
- ඇදහිලි හා විශ්වාස
- ස්ථාවර කෘෂිකාර්මික දිවිපෙවත.

## යෝජිත ඉගෙනුම් ක්‍රියාකාරකම්.

- දඩයම්, එඬේර හා ගොවි යුගවල මිනිස් ජීවිතයේ විවිධ අවස්ථා පිළිබිඹු කෙරෙන රූප සටහන් මගින් එම යුග පිළිබඳව අධ්‍යයන කිරීම.
- දඩයම් සහ එඬේර ජීවිතයේ දී මිනිසා මුහුණ දුන් අභියෝග පිළිබඳ සාකච්ඡා කිරීම.

## ගුණාත්මක යෙදවුම්.

- දඩයම්, එඬේර හා ගොවි යුගවල මිනිස් ක්‍රියාකාරකම් නිරූපණය කරන පින්තූර.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 6.3 ඒකකය

### නිපුණතා

- ශ්‍රී ලංකාව ජනාවාස වීම පිළිබඳව තොරතුරු අධ්‍යයනය කරයි.

### අනු නිපුණතා

- ආර්ය ගමනයට පෙර ශ්‍රී ලංකාවේ සිටි ජනතාව පිළිබඳව තොරතුරු ඉදිරිපත් කරයි.
- ශ්‍රී ලංකාව ආර්යයන් විසින් ජනාවාස පිහිටුවාලූ ආකාරය පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකාවේ ආර්යයන් ජනාවාස පිහිටුවා ගත් ස්ථාන සිතියමක ලකුණු කර නම් කරයි.

### විෂය අන්තර්ගතය කාලපරිච්ඡේද 05

6.3 ශ්‍රී ලංකාවේ ආර්ය ජනාවාස පිහිටුවීම.

6.3.1 විජයගේ පැමිණීම

- විජය කුමරු පැමිණි අවධියේ ශ්‍රී ලංකාවේ වාසය කළ ජනතාව
- විජය සහ පිරිසගේ පැමිණීම.

6.3.2 ජනාවාස පිහිටුවීම.

- සංක්‍රමණික කණ්ඩායම්
- ඔවුන් පිහිටුවා ගත් ජනාවාස.

### යෝජිත ඉගෙනුම් ක්‍රියාකාරකම්

- විජය පිළිබඳ ඇති පුරාවෘත්ත, පන්තිය වෙත ඉදිරිපත් කිරීම.
- ශ්‍රී ලංකාවේ සිතියමක ආර්යයන් ජනාවාස පිහිටුවා ලූ ප්‍රදේශ ලකුණු කොට නම් කිරීම.

### ගුණාත්මක යෙදවුම්

- මූල් ආර්ය ජනාවාස සිතියම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඒකකය 6.4

නිපුණතාව:

අනුරාධපුර යුගයේ රජවරුන්ගේ කාර්ය සංසිද්ධීන් අගය කරයි.

අනු නිපුණතා

- පණ්ඩුකාභය කුමරු මුහුණ දුන් අභියෝග ජයගනිමින් රාජ්‍යත්වයට පත්වූ ආකාරය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- පණ්ඩුකාභය රජුගේ රාජ්‍ය පාලන කටයුතු විමසා බලයි.
- පණ්ඩුකාභය රජ සමයේ පැවැති ආගමික ඇදහිලි හා විශ්වාස පිළිබඳ තොරතුරු පරීක්ෂා කරයි.
- පණ්ඩුකාභය රජ සමයේ පැවැති ජීවන රටාව පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

විෂය අන්තර්ගතය කාලපරිච්ඡේද 08

6.4 පණ්ඩුකාභය රජතුමා.

6.4.1 ළමා කාලය.

6.4.2 රාජත්වයට පත්වීම.

6.4.3 පාලන කටයුතු

6.4.4 ආගමික ඇදහිලි හා විශ්වාස

6.4.5 ජීවන රටාව

යෝජිත ඉගෙනුම් ක්‍රියාකාරකම්

- පණ්ඩුකාභය කුමරුගේ ළමා කාලයේ සිට රාජත්වයට පත්වීම දක්වා වූ කථා පුවත් ඇසුරින් කථාන්තරයක් නිර්මාණය කිරීම.
- පණ්ඩුකාභය රජු අනුරාධපුර නගරය සැලසුම් කළ ආකාරය පිළිබඳ සිතියමක් සකස් කිරීම.
- පණ්ඩුකාභය සමයේ ඇදහිලි හා විශ්වාස, ජීවන රටාව පිළිබඳ කථාන්තර මගින් අවබෝධ කිරීම.
- පඬුවස්නුවර පැරණි රාජධානියේ නටබුන් නැරඹීම සඳහා චාරිකාවක් සංවිධානය කිරීම.

ගුණාත්මක යෙදවුම්

පණ්ඩුකාභය රජු පිළිබඳ විස්තර ඇතුළත් පොත්

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඒකකය 6.5

## නිපුණතා

අනුරාධපුර යුගයේ රජවරුන්ගේ කාර්ය සංස්දිධීන් අගය කරයි.

## අනු නිපුණතා

- දේවානම්පියතිස්ස රජු හා ධර්මාශෝක රජු අතර පැවැති සබඳතා පරීක්ෂා කරයි.
- ශ්‍රී ලංකාවට බුද්ධාගම හඳුන්වාදීම සහ ව්‍යාප්තිය සම්බන්ධ තොරතුරු ගොනු කරයි.
- ශ්‍රී ලංකාවට බුදු දහමින් ලද දායාද අගය කරයි.

## විෂය අන්තර්ගතය                                        කාලපරිච්ඡේද 10

6.5 දේවානම්පියතිස්ස රජතුමා

- 6.5.1 අශෝක අධිරාජ්‍යා සමඟ පැවැත් වූ සම්බන්ධතා
- 6.5.2 බුද්ධාගම ශ්‍රී ලංකාවට හඳුන්වා දීම
  - මහින්දාගමනය.
  - සංඝමිත්තා තෙරණියගේ පැමිණීම.
- 6.5.3 බුද්ධාගමේ ව්‍යාප්තිය.
  - රාජ්‍ය අනුග්‍රහය
  - පූජනීය ස්ථාන පිහිටුවීම.
  - බුදු දහමින් ලද දායාද

## යෝජිත ඉගෙනුම් ක්‍රමවේද

- මිහිඳු හිමි, දේවනම්පියතිස්ස රජු හමුව භූමිකා රංගනයක් මගින් ඉදිරිපත් කිරීම.
- ශ්‍රී මහා බෝධිය ශ්‍රී ලංකාවට ගෙන ඒම දැක්වෙන චිත්‍රයක් නිර්මාණය කිරීම.
- දේවානම්පියතිස්ස රජු බුද්ධාගමට දැක්වූ අනුග්‍රහය පිළිබඳ පුවත්පතට ලිපියක් සකස් කිරීම.
- බුද්ධාගමින් ලද දායාද වගුවක් සකස් කිරීම.

## ගුණාත්මක යෙදවුම්

- මහින්දාගමනය හා සංඝමිත්තා තෙරණිය වැඩම කිරීම පිළිබඳ ඇති චිත්‍ර/ සිතුවම්.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඒකකය 6.6

නිපුණතා

- අනුරාධපුර යුගයේ රජවරුන්ගේ කාර්ය සංසිද්ධීන් අගය කරයි.

අනු නිපුණතා

- කාවන්තිස්ස රජුගේ කාර්ය සංසිද්ධිය විස්තර කරයි.
- එළාර රජුගේ දැහැමි පාලනය අගය කරයි.
- දුටුගැමුණු රජුගේ කාර්ය සංසිද්ධිය විමර්ෂණය කරයි.

විෂය අන්තර්ගතය කාලපරිච්ඡේද 12

6.6 දුටුගැමුණු රජතුමා

6.6.1 රෝහණ රාජ්‍යයේ දේශපාලන පසුබිම

6.6.2 එළාර රජු අනුරාධපුරයේ බලයට පත්වීම

6.6.3 කාවන්තිස්ස රජුගේ රාජ්‍ය කාලය

6.6.4 දස මහා යෝධයෝ

6.6.5 දුටුගැමුණු රජුගේ යුද්ධ කටයුතු හා දිවයින එක් සේසත් කිරිම.

6.6.6 දුටුගැමුණු රජුගේ ආගමික සේවාව.

යෝජිත ඉගෙනුම් ක්‍රියාකාරකම්

- එළාර රජු පිළිබඳ කථා පුවත් පන්තියට ඉදිරිපත් කිරිම.
- විහාර මහා දේවිය කථා පුවත ඇසුරින් චිත්‍ර නිර්මාණය කිරිම.
- විහාර මහා දේවි, කාවන්තිස්ස රජු , ගැමුණු කුමරු , තිස්ස කුමරු සහ දස මහා යෝධයෝ පිළිබඳ කථාන්තර රුස් කිරිම.
- දුටුගැමුණු රජුගේ සටන් ව්‍යාපාරය සිතියමක් මගින් පෙන්වා දීම.
- දුටුගැමුණු රජුගේ ආගමික සේවාව පිළිබඳ තොරතුරු විමසා බැලීම.

ගුණාත්මක යෙදවුම්.

- මහාවංශය
- දුටුගැමුණු රජුගේ සටන් ව්‍යාපාර සිතියම.
- දුටුගැමුණු රජු විසින් කරවන ලද වෙහෙර විහාර දැක්වෙන පින්තූර.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඒකකය 6.7

නිපුණතා

- අනුරාධපුර යුගයේ සංවර්ධන ක්‍රියාවලිය අගය කරයි.

අනු නිපුණතා

- අනුරාධපුර සමයේ වාරි කර්මාන්ත හා ඊට සම්බන්ධ රජවරු පිළිබඳ වගුවක් සකස් කරයි.
- අනුරාධපුර රාජධානිය අවසානය දක්වා වාරි කර්මාන්ත සිතියමක ලකුණු කර නම් කරයි .
- අනරාධපුර රාජධානි සමයේ කෘෂිකාර්මික කටයුතු පිළිබඳ තොරතුරු රැස් කරයි.

විෂය අන්තර්ගතය කාලපරිච්ඡේද 08

6.7 අනුරාධපුර රාජධානිය අවසානය දක්වා කෘෂිකර්මය හා වාරි කර්මාන්ත සංවර්ධනය.

6.7.1 වාරි කර්මාන්ත හා එයට සම්බන්ධ රජවරු

- වසභ රජු
- මහසෙන් රජු
- ධාතුසේන රජු
- පළමු වැනි අග්බෝ රජු
- දෙ වැනි අග්බෝ රජු
- දෙ වැනි මුගලන් රජු

6.7.2 කෘෂිකාර්මික කටයුතු

- මඩ ගොවිතැන
- ගොඩ ගොවිතැන
- සත්ත්ව පාලනය

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

යෝජිත ඉගෙනුම් ක්‍රියාකාරකම්

- අනුරාධපුර සමයේ වාරි කර්මාන්ත හා එයට සම්බන්ධ රජවරුන්ගේ වගුවක් සකස් කිරීම.
- අනුරාධපුර සමයේ වාරිමාර්ග සිතියමක් ලකුණු කිරීම.
- අනුරාධපුරයේ වැව් නැරඹීම සඳහා අධ්‍යාපන චාරිකාවක් සංවිධානය කිරීම.

ගුණාත්මක යෙදවුම්

- අනුරාධපුර වාරි කර්මාන්ත දැක්වෙන සිතියම

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ඒකකය 6.8

## නිපුණතාව

- අනුරාධපුර රාජධානි සමයේ ආගමික පුනර්ජීවනය විස්තර කරයි.

### අනු නිපුණතාව

- අනුරාධපුර සමයේ බිහි වූ ප්‍රධාන බෞද්ධාගමික මධ්‍යස්ථාන නම් කරයි.
- අනුරාධපුර රාජධානි සමයේ බිහි වූ බෞද්ධාගමික නොවන වෙනත් ආගමික මධ්‍යස්ථාන නම් කරයි.

## විෂය අන්තර්ගතය                    කාලපරිච්ඡේද 06

6.8 අනුරාධපුර රාජධානිය අවසානය තෙක් ආගමික දියුණුව

6.8.1 බෞද්ධාගමික මධ්‍යස්ථාන

මහා විහාරය, අභයගිරිය, ජේතවනාරාමය

6.8.2 වෙනත් ආගමික මධ්‍යස්ථාන

- ජෛන ආගමික සිද්ධස්ථාන
- හින්දු ආගමික සිද්ධස්ථාන

### යෝජිත ඉගෙනුම් ක්‍රියාකාරකම්

- බෞද්ධාගමික මධ්‍යස්ථාන සඳහා පහත වගුව සම්පූර්ණ කරන්න.

| බෞද්ධ මධ්‍යස්ථානය | අනුග්‍රහය දැක්වූ රජු | සිදු වූ සේවය |
|---|---|---|
| | | |

- අනුරාධපුර රාජධානි සමයේ පැවැති ජෛන හා හින්දු ආගමික මධ්‍යස්ථාන පිළිබඳ තොරතුරු ගවේෂණය කිරීම.

## ගුණාත්මක යෙදවුම්

- අනුරාධපුර සමයේ ආගමික ගොඩනැගිලිවල පින්තූර

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.